PMoE
Sabaragamuwa

මගේ අංකය
எனது இல
ஆல ரேஅடிநச
ME/E/02 /චක්‍රලේඛ

සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

ඔබේ අංකය
உமது இல
Your Number

දිනය
திகதி
Date
2022/10/13

අමාත්‍යාංශ ලේකම්
Secretary
Office – 045 2223015 Residence – 045 2232985

කාර්යාලය
Office
නවනගරය,රත්නපුර.
Newtown, Rathnapura.
Office - 045 2222542 Fax - 045 2228042

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක : සබර/2022/05**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සබරගමුව,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම විදුහල්පතිවරු,

**<u>මුදල් අයකර පෞද්ගලික පන්ති පැවැත්වීම / ගුරුවරුන්ගේ විනය සම්බන්ධවයි</u>**

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක සබර/2016/08 හා 2016/12/31 සඳහා වැඩිමනක් වශයෙනි.

02. ඉහත චක්‍රලේඛ හා උපදෙස් උල්ලංඝනය කරමින් ඇතැම් ගුරුභවතුන් මුදල් අයකරමින් පෞද්ගලික උපකාර පන්ති පවත්වනු ලබයි. මෙහිදී පාසලේ තමන් උගන්වනු ලබන දරුවන් සඳහා තම උපකාර පන්තියට සහභාගීවන ලෙසට ගුරුවරු විසින් බලපෑම් එල්ල කරනු ලබන අතර, එම පන්ති සඳහා සහභාගී නොවන දරුවන් සඳහා පාසලේදී ඉගැන්වීම් කටයුතු වලදී නිසි අවධානයක් යොමු නොකරන බවටද විවිධ කායික මානසික පීඩා වලට ලක් කරන බවටද පැමිණිලි ඉදිරිපත් කර ඇත.

03. එමෙන්ම පාසලේදී දරුවන් ඇතැම් විදුහල්පතිවරු හා ගුරුවරු විසින් මානසික පීඩාවන්ට පත් කරන අයුරින් විවිධ ක්‍රියාවන් සිදු කරන බවටද චෝදනා එල්ල කර ඇත.මේ හේතුවෙන් දරුවන් මෙන්ම දෙමාපියන්ද පීඩනයට හා අසරණභාවයට පත්වී ඇත.

04. තවද ඇතැම් විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් තම වෘත්තීය ගෞරවය නොසලකා විවිධ සමාජ ජාල මාධ්‍යය ඔස්සේ කරනු ලබන ප්‍රචාර හේතුවෙන් තම වෘත්තිය ගෞරවය විනාශ වීමට ලක්ව ඇත. එබැවින් 37/2012 චක්‍රලේඛය පිළිබඳ නැවත අවධාරණය කරන අතර මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් තරයේ පිළිපදින ලෙස දන්වමි.

05. ඒ අනුව ඉහත තත්ත්වයන් වළක්වා ගනිමින් කටයුතු කරන ලෙසට සියලු විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කරන ලෙසත්, එසේ කටයුතු නොකරන නිළධාරීන් සඳහා දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවත් දන්වා සිටිමි. එමෙන්ම ඉහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් දැඩි අධීක්ෂණයක් සිදු කරන ලෙසටත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සුජානි ආර්. විජේතුංග,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමු පළාත් සභාව.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
රත්නපුර

පිටපත්

01. ප්‍රධාන ලේකම්,(සබරගමුව පළාත් සභාව) - කා.දැ.ස.
02. ආණ්ඩුකාර ලේකම්, - ගුරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා